““
# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2135/14 – 2019 අගෝස්තු 05 වැනි සඳුදා – 2019.08.05**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/සීඕඑම්/04/වී/2015/94.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2018.01.10 වන දින අංක 2053/27 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2017.12.29 වැනි දින දරන නියෝගයෙන්,

ආර්. යූ. එම්. එස්. රාජකරුණා මයා, අංක 71/4, හේවාහැට පාර, තල්වත්ත, මහනුවර.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර පවත්නා 2017.12.22 දින දරන කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පී. දනන්සූරිය මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර

1A – G 30671 – 21(2019/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2017.12.29 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 ජූලි මස 24 වැනි දින,
කොළඹ දී ය.

8 - 719/1

---

මගේ අංකය: අයිආර්/සීඕඑම්/04/වී/2015/94.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමකර දක්වා ඇති කාරණය පිළිබඳව –

ආර්. යූ. එම්. එස්. රාජකරුණා මයා, අංක 71/4, හේවාහැට පාර, තල්වත්ත, මහනුවර.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කටුගස්තොට, ගොහාගොඩ පාර, අංක 599, එච්. එම්. අනුලාවතී මෙනවිය පත්කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 ජූලි මස 24 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: අයිආර්/සීඕඑම්/04/වී/2015/94.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ආර්. යූ. එම්. එස්. රාජකරුණා මයා, අංක 71/4, හේවාහැට පාර, තල්වත්ත, මහනුවර.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ යටිනුවර ඩිපෝවේ සේවය කරන ආර්. යූ. එම්. එස්. රාජකරුණා මහතාට මහනුවර බස් කම්පැනි ලිමිටඩ් හි සේවක මණ්ඩල කළමණාකරුගේ අංක මබස/සේමකො/පා/01/2004 හා 2004.01.29 දිනැති ලිපිය මගින් ලබා දී තිබූ වැටුප් වර්ධක මහනුවර බස් කම්පැනි ලිමිටඩ් සේවක මණ්ඩල කළමණාකාරගේ අංක මබස/සේමකො/පා/04/2004 හා 2004.06.21 දිනැති ලිපිය මගින් අඩුකිරීම යුක්ති සහගතද යන්න හා එලෙස යුක්ති සහගත නොවන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ'' .

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 ජූලි මස 14 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

08 - 719/2

---

මගේ අංකයː අයිආර්/සීඕඑම්/01/2017/256.

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත

(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

ටී. තුෂ්‍යන්තන් මයා, අංක 45, සෙල්වනගර්, එළුතූර්, මන්නාරම.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මන්නාරම ඩිපෝවේ සේවය කළ ටී.තුෂ්‍යන්තන් මහතා ආයතනය ඉදිරිපත් කළ ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය යටතේ සේවයෙන් ඉවත් වීමට ඉල්ලුම් කළ ද වන්දි ගෙවීම ප්‍රමාදවීම හේතුවෙන් එම යෝජනා ක්‍රමයෙන් ඉවත් වී නැවත රැකියාව ඉල්ලා සිටියද, එය ලබා නොදීමෙන් ටී. තුෂ්‍යන්තන් මහතාට අසාධාරණයක් සිදුවී තිබේද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද පිළිබඳව වේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 ජූලි මස 14 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

මගේ අංකය: අයිආර්/සීඕඑම්/01/2017/256.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියමකර දක්වා ඇති කාරණය පිළිබඳව –

ටී. තුෂ්‍යන්තන් මයා, අංක 45, සෙල්වනගර්, එළුතූර්, මන්නාරම.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කටුගස්තොට, යටිවාවල, අරලිය උයන ''මිගදාය'', අංක 339/01/ඩී/2, එල්. ආර්. සුමතිපාල මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

රවීන්ද්‍ර සමරවීර,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 ජූලි මස 24 වැනි දින,
කොළඹ දී ය.

8 - 720

---

මගේ අංකය: අයිආර්/සීඕඑම්/03/2018/203.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියමකර දක්වා ඇති කාරණය පිළිබඳව –

එක් පාර්ශ්වයක් වශයෙන් :

ජේ. පී. එස්. කුමාර සේනාධීර මයා, 308/ඒ, අක්කර 500, බෝධිරාජ මාවත, 2 වන පටුමග, නවනගරය පොළොන්නරුව.(ඇතුළු සේවක පිරිස)

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්, නිමාව, කොලොන්නාව.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ

ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, දිවුලපිටිය, මාපලන්ගෙදර, අංක 160, කේ. එම්. සරත්චන්ද්‍ර මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 ජූලි මස 24 වැනි දින,
කොළඹ දී ය.

---

මගේ අංකය: අයිආර්/සීඕඑම්/03/2018/203.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්

ජේ. පී. එස්. කුමාර සේනාධීර මයා, 308/ඒ, අක්කර 500, බෝධිරාජ මාවත, 2 වන පටුමග, නවනගරය පොළොන්නරුව.(ඇතුළු සේවක පිරිස)

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ්, නිමාව, කොලොන්නාව.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් ආයතනයේ සේවය කරන ජේ. පී. එස්. කුමාර සේනාධීර ඇතුළු පහත නම් සඳහන් සේවකයින් 7 දෙනා ආයතනයේ ''බී 1 ශ්‍රේණියේ පිරවීම් අධීක්ෂණ තනතුරට'' බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයට නොකැඳවීමෙන් ඔවුන්ට යම් අසාධාරණයක් සිදුවූයේද යන්න හා එසේ අසාධාරණයක් සිදුවූයේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ'' .

1. ජේ. පී. එස්. කුමාර සේනාධීර
2. ඩිලාන් යසන්ත සෝමපාල
3. එම්. ජී. බුද්ධික
4. කේ.ජී.කේ.ආර්. ස්වර්ණතිලක
5. පී. ජී. ඒ. එස්. කේ.අභයසිංහ
6. පී. කේ. ජී. ආර්. පී. වීරමල්ලව
7. එච්. එම්. එස්. කේ. හේනායක

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 ජූලි මස 19 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

08 - 727

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.